නිලධාරී තනතුරු සඳහා පත් කර ඉහළ වැටුප් හා වරප්‍රසාද ලබා දෙන ලද අතර මිළ දී ගැනීම් හරහා ද දැවැන්ත දූෂණ කරන ලදී.

රාජපක්ෂවාදය මත පදනම් වන රාජපක්ෂ ක්‍රමයේ මූලික ම ආර්ථික ගැටලුව නිර්මාණය කරන්නේ ද මෙම දැවැන්ත රජය විසිනි. වැඩ නොකරන අති විශාල පිරිසක් විසින් සාරය උරා බොනු ලබන රජය නඩත්තු කිරීම සඳහා අතිවිශාල බදු බරකට මුහුණ දීමට වැඩ කරන ජනතාවට හා ව්‍යවසායකයන්ට සිදු වේ. මේ රජය පවත්වාගෙන යාම සාධාරණීකරණය සඳහා ඔවුන් රටට ඔරොත්තු නොදෙන තරමේ, ඇස් ගිනිකණ වට්ටන මෙගා සංවර්ධන ව්‍යාපෘති වෙත යොමු වෙති. ඒ වෙනුවෙන් අති විශාල වශයෙන් විදෙස් ණය ලබාගැනීමට ද, ඒ ණයට ගෙවීමට සිදු වන පොළිය හා අනාගතයේ ඒ ණය ගෙවන ආකාරය ගැන නොසිතා සිටීමට ද ඔවුන්ට පුළුවන. රජය යනු මහජන සේවය සඳහා පවත්වාගෙන යන, රටට සෞභාග්‍යය උදා කරන, ඒ අන්දමින් ම රැකගත යුතු දෙයක් ය යන ව්‍යාජය ඔවුහු සමාජය තුළ නිර්මාණය කරති. එය විශ්ඥානයක් ලෙස කෙතරම් සමාජ දේහය පුරා පැතිරී තිබේ ද යත්, අද වන විට රජය පවත්නා සැටියෙන් ආරක්ෂා කරගැනීම සඳහා දිවි හිමියෙන් පෙනී සිටින්නේ වාමාංශිකයන් සහ විප්ලවවාදීනුයි.

රජය මූලික කරගත් ආර්ථිකය එතනට සීමාවෙන්නේ නැත. එය සමාජ විශ්ඥානයක් බවට ද පත් වේ. සමාජයේ ජීවන පරමාදර්ශ නිර්මාණය වන්නේ රජය හා එහි කළමනාකරුවන් වන දේශපාලක යන්, නිලධාරීන් හා රජයේ සේවකයන්ගේ ජීවන විලාසය අනුවයි. අඩුවෙන් වැඩ කර වැඩියෙන් වැටුප් ලැබීම, මහජන මුදලින් විදෙස් චාරිකාවේ සිට දුම්රිය සීසන් ටිකට්ටුව දක්වා වරප්‍රසාද ලබාග ැනීම, සෙසු වැඩකරන ජනයාට අහිමි විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබාග ැනීම ආදිය අනුව ගොඩනගාගන්නා ශ්‍රමය පිළිබඳ මූලික ආකල්ප රාජපක්ෂ ක්‍රමයේ මූලික ලක්ෂණයි. ඉක්මණින් හා පහසුවෙන් සල්ලි හෙවීමට නම් රජය සමග සම්බන්ධ විය යුතු ය. දේශපාලකයකු, දොස්තර කෙනෙකු විය යුතු ය. කය, මනස මෙහෙයවා වැඩ කිරීම කාලකණ්ණිකමකි.

රාජපක්ෂ ක්‍රමයේ වින්දනීය අක්ෂය සරල විනෝදාස්වාදයක් මත පදනම් වේ. ඔක්ටොපෑඩය මූලික කරගත් රාත්‍රී සංගීත සංදර්ශනවල සිට කඨින පෙරහැර දක්වා වන චොකා බයිලා සංදර්ශන හැර ගැඹුරු රසවින්දනයක් රාජපක්ෂ සංස්කෘතියේ නැත. උසස් කලාව හා රසාස්වාදය රාජපක්ෂ සංස්කෘතියට අරහන් ය. එහි හිස්බව වසාගන්නේ ජාතිවාදයේ හා ආගම්වාදයේ දීප්තිමත් වර්ණ යෙදූ ඝන අයිසිං තට්ටුවකිනි. එතනින් එහාට රාජපක්ෂ ක්‍රමය වන්නේ අධික පාරිභෝජනයයි. නිරුවත් භාණ්ඩ වන්දනාවයි. සරලව කිවහොත්, වස්තුව හා දේපල මිළ දී ගැනීම හා ගොඩගසාගැනීමයි. ඒ වෙනුවෙන් දුක් විඳීමයි.

මේ සියලු තත්වයන් සමග සමාජය තුළ දිනෙන් දින මෝදු වන ආතතිය පාලනය කරගැනීම සඳහා රාජපක්ෂවාදය හැමවිට ම සරණ යන්නේ ජාතිවාදය හා ආගම්වාදය ඇතුළු සකලවිධ පසුග ාමිත්වයන් මත ය. එහි ප්‍රචණ්ඩත්වය වරින් වර තීව්‍ර කිරීමට ද ඔවුන්ට සිදු වේ. මෙම ස්වෝත්තමවාදී ප්‍රවණතා බොහෝ විට ස්ත්‍රීන්, සමලිංගිකයන්, සංක්‍රාන්ති ලිංගිකයන් වැනි අය වෙත ද යොමු වේ.

රාජපක්ෂ ක්‍රමය තුළ තිබෙන මෙම මූලික ලක්ෂණ එක්සත් ජාතික පක්ෂය මූලික කරගත් පාලනය තුළ නැති බවක් එයින් අදහස් වන්නේ නැත. එසේම, රාජපක්ෂ ක්‍රමය රාජපක්ෂ ජනාධිපති වෙන් නට පෙර සිට ම මේ රටේ පැවති එකකි. රාජපක්ෂ පාලන සමය තුළ එය රාජපක්ෂ විසින් බුක්තියට ලියාගන්නා ලදී. නිදසුනක් ලෙස රාජපක්ෂට පෙර බොහෝ සිංහල ජාතිවාදී ප්‍රවණතා තිබුණමුත්, දැන් එය රාජපක්ෂවාදය විසින් තනි බුක්තියට අත්පත් කරගෙන හමාර ය. ලංකාවේ පසුගාමිත්වය රාජපක්ෂ ක්‍රමය ලෙස නාමක රණය වන්නේ රාජපක්ෂවාදය එහි නායකත්වය අත්පත් කරගත් නිසා ය. රාජපක්ෂ ක්‍රමයට එරෙහි ප්‍රවණතා රාජපක්ෂ අනුගාමිකයන් අතර මෙන් ම ඇතැම් විට රාජපක්ෂ පවුලේ පවා තිබේ. උදාහරණය ක් ලෙස බැසිල් රාජපක්ෂ අනුගාමිකයන් හා බැසිල් රාජපක්ෂ ම පවා යම් ලිබරල් ලක්ෂණවලින් යුක්ත ය. විටෙක මහින්ද ළඟ පවා ඒ ලක්ෂණ තිබේ.

රාජපක්ෂවාදය හා රාජපක්ෂ ක්‍රමය තව දුරටත් විග්‍රහ කළ යුතු එකකි. එසේම, කොන්දේසි විරහිතව පරාජය කළ යුතු එකකි.

# 6 මට හැඟෙන අයුරින් රසිකොලොජිය

rasikalogy.blogspot.com



# ජනාධිපති හොරු

ලංකාවේ මියගිය, හිටපු, ඉන්නා සහ වෙන්ඩ ජනාධිපතිලා ගේ වැඩකිඩ ගැන සයිබර් අවකාශයේ නිරතුරු කියවෙන මේ දිනවල, මා මීට වසර දහයකට පමණ පෙර ජනවාරියක, සිනුවර වේලාවෙන් හිමිදිරි උදෑ සනක, එක්තරා ජනාධිපතිවරයෙකු දිවුරුම් දෙන අයුරු රූපවාහිනියෙන් නරඹමින් ලියූ කවි පන්තියක් මගේ සිහියට නැගුණි. මේ කවි ලියවුණේ 2009 ජනවාරියේ දී ය. ඒ ඇමරිකා එක්සත් ජනපදයේ ප්‍රථම කලු ජාතික ජනාධිපති ලෙස බරක් ඔබාමා දිවුරුම් දුන් දිනයේ ය. මුලින් ඒ කවි පන්තිය කියවන්න.

ඔබමා බරක් එක්සත් ජනපදයේ
ජනපති විලස දිවුරුම් දුන් අද දිනයේ
නෙත නැගි තුටු කඳුළු පිස දා ලහි ලහියේ
මේ කවි ලියමි හිරු නැග එන හිමිදිරියේ

වසවර්තියෙකු වුව ජනපති වෙනු පිණිස
ඡන්දය ඉල්ලනා විට බෝසත්ය යස
බෝසත් කෙනෙකු වුව ජනපති වූ විගස
වසවර්තියා වැඩි හොඳ බව නැත කුකුස

ඡන්දෙට කලින් මැති දුටු සඳ කුමක් වැනී
කලකින් නුදුටු හිත මිතුරෙක් දැක්ක වැනී
ඡන්දෙන් පසුව මැති දුටු සඳ කුමක් වැනී
අලුගෝසුවා රෑ මැද හමුවුණා වැනී

බලයට එන්න පෙර නිදහස භාෂණයේ
පරමාදර්ශයයි මැතිඳුගෙ චින්තනයේ
තම පණ වුවද දෙන්නයි සැරසී සිටියේ
අමතක වේ ද බලයට පත් වූ හැටියේ

ෆොක්ස් ටෙලිවිෂනයට ගින්දර තැබේවි ද
වොෂින්ටන් පෝස්ට් කතුවර මැරේවි ද
අල් කයිඩා ව ගැන ලිපියක් ලියන ලද
උප කතුවරුන් හෙට සිරගෙට වැටේවි ද

වධකාගාර ගන්තනමෝ බටලන්ද
වැලලූ මිනී අබු ග්‍රේ සූරියකන්ද
දැම්මත් බලය ගන්නට පෙර මහ සද්ද
කොමිෂන් වාර්තාවට සීමා වෙද්ද

සේරු අටක් ඇට හැම ගෙට එවන්නට
නැති බැරි පිරිස ඇති හැකි අය කරන්නට
සමුර්දියක්, ජනසවියක් දෙවන්නට
දුන් සැම පොරොන්දුව අමතක වේද හෙට

බුෂ් ගේ ප්‍රජා අයිතිය හෙට නිමවේද
රට හැම තැනම පෑ තැටි ඉඳි කරවේද
චෞර රජා ලෙස හොඳ නම හිමිවේද
පෙන්ටගනයෙ ජොබ් එක මල්ලිට යාද

විපක්ෂයේ ඉඳ සිල් අරගෙන වාගේ
රටේ ප්‍රශ්න විසඳිය හැක කජු වාගේ
එරට මෙරට කොයි දේසෙත් එක වාගේ
බලමු හෙට කෙරුම් ජනපති ඔබමා ගේ

සාමය කෙසේ වෙතත්, ලොව පුරා යුද්ධ කිහිපයක් ම අරඹා, වසර අටක් සේවය කර, යන්තම් ජාම් බේරාගෙන ඔබාමා ගෙදර ගියේ ය. අප දන්නා අනෙකුත් ජනාධිපතිලා මාසෙන් දෙකෙන් කෙසෙල් කොලේ ඉරා ගත්හ. යන යන තැන කක්කා කර ගත්හ. හත් පොලේ ගා ගත්හ. ඉතිහාසය බො හෝ විට නැවත සිදුවෙයි. නැවත නැවත සිදුවෙයි. ඒ සඳහා පස්මහ බැලීම් අවශ්‍ය නැත. එකම කවි පන්තිය නැවත නැවත පළ කරන්නට මට හැකි වී ඇත්තේ එනිසා ය.